**රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍ර නිකුත් කිරීමට යෝජිත පුද්ගලයන්ගේ ලැයිස්තුව.**

| | |
|---|---|
| 01 | ජනාධිපතිවරයා , කලත්‍රයා හා ඔවුන්ගේ පුත්‍රයන් හා දියණියන්. |
| 02 | අග්‍රාමාත්‍යවරයා , කලත්‍රයා හා ඔවුන්ගේ පුත්‍රයන් හා දියණියන්. |
| 03 | හිටපු ජනාධිපතිවරුන්. හිටපු අග්‍රාමාත්‍යවරුන්, කලත්‍රයන් හා ඔවුන්ගේ අවිවාහක පුත්‍රයන් හා දියණියන්. |
| 04 | කථානායකවරයා, අගවිනිසුරුවරයා, අමාත්‍යවරුන්, විපක්ෂ නායකවරයා කලත්‍රයන් හා ඔවුන්ගේ අවිවාහක පුත්‍රයන් හා දියණියන්. |
| 05 | හිටපු ජනාධිපතිවරුන්ගේ හා අග්‍රාමාත්‍යවරුන්ගේ වැන්දඹුවන්. |
| 06 | ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් හා ඔවුන්ගේ කලත්‍රයන්, වයස අවුරුදු 21 දක්වා වූ ඔවුන්ගේ අවිවාහක පුත්‍රයන්, අවිවාහක දියණියන්, වයස නොතකා නිලධරයා ගෙන් යැපෙන කායිකව හෝ මානසිකව ආබාධිත වූ දරුවන් ඇතුළුව පවුලේ සාමාජිකයන්. |
| 07 | විදේශ දූත මණ්ඩල සඳහා අමාත්‍ය මණ්ඩල තීරණ යටතේ පත්කරනු ලැබූ නිලධාරින්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, වාණිජ දෙපාර්තමේන්තුවේ, ආරක්ෂක අමාත්‍යාංශයේ, කම්කරු දෙපාර්තමේන්තුවේ, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ හා වෙනත් ඕනෑම රාජ්‍ය ආයතනයක නිලධාරීන් හා ඔවුන්ගේ කලත්‍රයන්, අවුරුදු 21 ක් දක්වා වූ අවිවාහක පුත්‍රයන්, අවිවාහක දියණියන්, වයස නොතකා නිලධරයාගෙන් යැපෙන කායිකව හෝ මානසිකව ආබාධිත වූ දරුවන් ද ඇතුළුව එකී නිලධරයන් ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල සේවයේ රාජ්‍යතාන්ත්‍රික තනතුරක් දරණ තුරු පමණක් ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල සේවයේ රාජ්‍යතාන්ත්‍රික තනතුර දරණ වෙනත් රටවල රජයන් සඳහා නිල වශයෙන් පිළිගනු ලැබූ ශ්‍රී ලංකා රජයේ නියෝජිතයන් |
| 08 | පළාත් ආණ්ඩුකාරවරුන් , ඔවුන්ගේ කලත්‍රයන් , අවිවාහක පුත්‍රයන් හා දියණියන්. |
| 09 | පළාත් ප්‍රධාන අමාත්‍යවරුන් , රාජ්‍ය අමාත්‍යවරුන් , ඔවුන්ගේ කලත්‍රයන් , අවිවාහක පුත්‍රයන් හා දියණියන්. |
| 10 | නියෝජ්‍ය කථානායක, නියෝජ්‍ය අමාත්‍යවරුන්, ව්‍යාපෘති අමාත්‍යවරුන්, කැබිනට් නොවන අමාත්‍යවරුන්, පාර්ලිමේන්තු කමිටුවල නියෝජ්‍ය සභාපතිවරුන්, පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක , ඔවුන්ගේ කලත්‍රයන්, අවිවාහක පුත්‍රයන් හා දියණියන්. |
| 11 | ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයන්, 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පත් කරනු ලැබූ කොමිෂන් සභාවල සාමාජිකයන්. |
| 12 | නීතිපති. |
| 13 | ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්. |
| 14 | අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන්. |
| 15 | පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හා ඔවුන්ගේ කලත්‍රයන්. |
| 16 | පළාත් සභාවල සභාපතිවරුන්, පළාත් අමාත්‍යවරුන් හා ඔවුන්ගේ කලත්‍රයන්. |
| 17 | ජනාධිපති ලේකම්. |
| 18 | අග්‍රාමාත්‍ය ලේකම්. |
| 19 | අමාත්‍ය මණ්ඩලයේ ලේකම් |
| 20 | මහ බැංකු අධිපති. |

| | |
|---|---|
| 21 | කැබිනට් අමාත්‍යාංශ ලේකම්වරු.<br>පාර්ලිමේන්තු මහ ලේකම්.<br>ජනාධිපති ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩල ප්‍රධානී.<br>අග්‍රාමාත්‍ය කාර්යාලයේ කාර්ය මණ්ඩල ප්‍රධානී.<br>ජනාධිපති උපදේශකවරු.<br>පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් - (ඔම්බුඩ්ස්මන්)<br>භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්.<br>විගණකාධිපති.<br>මැතිවරණ අධ්‍යක්ෂ ජනරාල්.<br>අග්‍රාමාත්‍ය උපදේශකවරු. |
| 22 | පාර්ලිමේන්තු සභානායකගේ ලේකම්.<br>පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකගේ ලේකම්. |
| 23 | කැබිනට් නොවන අමාත්‍යාංශ ලේකම්වරු.<br>ජනාධිපති අතිරේක ලේකම්වරු.<br>ප්‍රධාන ලේකම්වරු. |
| 24 | ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී.<br>යුද හමුදාපති / නාවික හමුදාපති / ගුවන් හමුදාපති / පොලිස්පති. |
| 25 | මල්වතු , අස්ගිරි , රාමඤ්ඤ, අමරපුර නිකායවල මහනායක ස්වාමීන් වහන්සේලා.<br>රෝමානු කතෝලික පල්ලියේ අගරදගුරුතුමා.<br>අනෙකුත් ආගම්වල ප්‍රධාන පූජකවරුන්. |
| 26 | ජාතික බුද්ධි අංශ ප්‍රධානී. |
| 27 | විදේශ කටයුතු ලේකම්වරයාගේ නිර්දේශය මත තේ ප්‍රවර්ධන කටයුතු (විදේශ) පිළිබඳ විෂය භාර කොමසාරිස්වරයා. |
| 28 | කොළඹ , මහනුවර මහ නගර සභාවල නගරාධිපතිවරුන්. |
| 29 | පාලක ජනරාල්, ආගමන හා විගමන<br>අධ්‍යක්ෂ ජනරාල්, අල්ලස් හෝ දූෂණ වංචා විමර්ශන<br>අධ්‍යක්ෂ ජනරාල්, රේගු<br>අධ්‍යක්ෂ ජනරාල්, විදේශ සම්පත් |

<u>විශේෂ සටහන්</u>

- මෙම අනුමත ලැයිස්තුවෙහි සඳහන් නාමයන් වෙනස් කිරීම ජනාධිපතිතුමාගේ එකඟත්වය මත ජනාධිපති ලේකම්ගේ අත්සනින් නිකුත් කරනු ලබන ලිපියක් මඟින් පමණක් විය යුතුය.
- සියළු අමාත්‍යාංශ ලේකම්වරු/ආයතන ප්‍රධානීන් විසින් රාජ්‍යතාන්ත්‍රික ගමන් බලපත්‍ර නිකුත් කිරීම ලේඛනගත කර අදාල තනතුර/ධූරය අවසන් වූ වහාම ආගමන විගමන පාලක ජනරාල් වෙත දැනුම් දිය යුතුය.
- ආගමන විගමන පාලක ජනරාල්වරයා විසින්ද රාජ්‍යතාන්ත්‍රික ගමන් බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යායුතුය.
- 2015 ජනවාරි 08 දිනට පෙර සිට රාජ්‍යතාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍ර පාවිච්චි කරන ලද අයවළුන් දැනට මෙකී ගමන් බලපත්‍ර ලැබීමට සුදුසු යම් තනතුරක් නොදරන්නේ නම්, කලින් නිකුත් කර තිබූ රාජ්‍යතාන්ත්‍රික ගමන් බලපත්‍ර භාවිතය වැලැක්වීම සඳහා ආගමන විගමන පාලකවරයා වහාම පියවර ගත යුතුය.